

# ආදරයේ ප්‍රභේද

මම මෙච්චර ආදරේ ගැනම කතාකරන්නේ ඇයි කියලා මටම හිතාගන්න බැහැ. මම දැන් මේ ආදරෙන් හෙම්බත්වෙලා. ඒත් ලියන්නේ ඒ ගැනමයි. අද මම කතාකරන්න යන්නේ එක් එක් ආදර වර්ග ගැනයි. මෙතනදි ඔන්න මට මතක් වෙනවා ආත්තම්මව. එයාට රහට උයන්න පුලුවන්. එයා නිතරම කෑම වර්ග කරනවා. ඉස්සරහ කෑම, පිටිපස්සේ කෑම. පිටිපස්සේ කෑමට අයිතිවෙන්නේ පොළොස් ඇඹුල්, කිරිකොස් මාලුව, මුන් ඇට නියඹලාව, බිම්හතු මාලුව, කරවල බැදුම වගේ දේවල්. ඉස්සරහ කෑමවලට කට්ලට්ස්, පැටිස්, රෝල්ස් වගේ දේවල්. මාලුත් වර්ග කරනවා. මිරිසට, කිරට, බැදුම, තෙල් දැමීම. උඩරටපැත්තේ මාලු ඇඹුල් තියල් කිරීමක් නම් නැහැ. හැබැයි මිරිසට උයනවා. එකමදේ උඩරට පැත්තේ ඞඇඹුල් තියල්ඞ කිරිල්ලක් නැති නිසා එක්තරා ආදර වර්ගයක් මගේ අතින් ලෙස්සිලා යයිද දන්නේ නැහැ.

**1. සාමාන්‍ය ආදරේ**

තරුන, තරුනියන් එක්තරා වයසකට එනකොට ස්වාභාවිකව සිදුවෙන ක්‍රියාවලියක්. කවුරුහරි දෙන්නෙක් දකිනවා, කැමතිවෙනවා, මල්සරාත් හරියට වෙලාවට මල්දුන්නෙන් විදිනවා. එකම ප්‍රශ්නේ තමයි වැඩියෙන් හොඳ අය දැක්කාම මල්සරා ඒ පැත්තට හැරෙන එක. ඒ හන්දා එයාටත් දැන් වැඩ වැඩී.

**2. පරාජිත ආදරේ**

කෙනෙක් ආදරේ කරනවා අනික් කෙනාගේ ආදරේ ලැබුනත්, නැතත්. බොහෝ විට නොලැබී. මෙන්න මේක තමා අපේ සාහිත්‍ය පෝෂණය කරන වැදගත්ම ආදරේ. ඒ හන්දා කවි, කතා, ගී පද ඔය හැම දේම ලියැවෙනවා. ලදුරින් හිඳ මා පෙම් කරන්නම්ල ලපාලු අඳුරු නිල් අහස මමයි, ඈත දිලෙන තනිතරුව ඇයයිල වගේ දේවල්. මම නම් ඕක ගායනා කරන්නේ ලඇත දිලෙන රන් තරුව මමයිල කියලා. මොකද මම කැමති ඈත ඉදන් ආදරෙන් පැරදුනු අයට පිහිට වෙන්ට. අල්ලපු ගෙදර රවි මහත්තයා කීව වගේ මේ ඉන්න දෙදොහට කාටහරි පිහිටවෙන්න පුලුවන් නම් මොන තරම් දෙයක්ද? අනෙක් එක මහත්මා ගාන්ධි වගේ කෙනෙක් ඒ ගැන කියල තියෙද්දිත්.

**3. blow hot and blow cold ආදරේ**

ඒක හරිම අමුතු ආදරයක්. මේ දැන් ආදරේ, මේ දැන් නෑ. හිත හදාගන්න බැරි අයගේ තමා මේ වගේ ආදරයක් තියෙන්නේ. ඒ ගැන නම් පොඩි පරීක්ෂනයක් නොකර මුකුත් කියන්න බැහැ.

**4. ප්ලේටෝනියානු ආදරේ (Platonic love)**

මේකත් අල්ලපු ගෙදරක කෙනෙක් ලියලා තිබුනු හන්දයි හොයලා බැලුවේ. ඒ කියන්නේ අද්‍යාත්මික ආදරයක්. කායික ආදරයක් එහෙම නෙමේ. උදාහරනයකට අරන් තිබුනේ සරත්චන්ද්‍රගේ "මළගිය ඇත්තෝ" හි දේවෙන්දොරා සන්ගේ චරිතය. මට නම් ඒක දැකලා හිතුනේ දෙවේන්දොරා සන් , නොරිකෝ සන් එක්ක එකට ඔච්චරකල් ඉඳලා, පොල් ගෑවද කියලා. ආදරේ කොහොම වෙතත් උදාහරනේ නම් වැරදි.

**5. අගාපේ ආදරය (Agape Love)**

අප්පේ අපි කල්පනා නොකලට තියන ආදර ගොඩ. මේක නම් ලෙහෙසි පහසු ආදරයක් නෙමේ. ආදරය වෙනුවෙන් ජීවිතේ උනත් පුජා කරන විදියේ එකක්. මුල් ජාතිය හා සමානයි. කායික බැඳිලි නැහැ. පොඩි ලමයි මේවා දැකලා හිත අවුල් කරගන්නේ එහෙම නෑ. ඔයාලට මේ වගේ ආදර ගැන හිතන්න තව ගොඩක් කල් තියනවා. ටිකක් වයසට කාරිය යන්න ඕනි මේ විදියට ආදරේ කරන්න.

මීට අමතර ආදර වර්ගත් ඇති. ඒව ඉතින් මට දන්න අය ලියලා එවන්න. කරුනාකරලා බුදුන් වහන්සේ ලග ලෝක සත්වයාට තිබුන ආදරෙයි, අම්ම කෙනෙක්ගේ දරුවන්ට තියන සෙනෙහසයි මේකට ගාවන්න එපා. මම කතා කරන්නේ අර "රාගයෙන් තොර සඳ එළියසේ..." අන්න ඒක ගැන.

අනෙක ප්ලේටෝ කියලා තියනවලු, "At the touch of love everyone becomes a poet" කියලා. මට කවි ලියන්න බැරි හේතුව යාන්තම් හොයාගත්තා. ප්ලේටෝට පින්සිදුමවේවා, ඒ කාරනාව විස්තර කරලා දුන්නට.

**පොඩි කුමාරිහාමි,**

මහ වලව්ව.





**OUT NOW**
**A Collection of Essays On Sri Lanka**

*Written by* **Dr Mathu H. Liyanage PhD., M.Litt., BA (Hons.).**

**Mathu Liyanage's third book, *A Collection of Essays on Sri Lanka*, containing 50 essays written recently and published by him, from time to time, in the Ceylon Daily News (Sri Lanka), Pahana and Sannasa, two national newspapers published in Melbourne, is out on sale now.**

It contains articles on *Paddy cultivation: a national life blood, The Great Message of the Buddha, China a country rising against the wind, The agony of GSP+, Rising food prices a world phenomenon, Road to social justice rugged and rocky, One country one nation: the key to peace and prosperity, The triumphal march of President Mahinda Rajapaksa, Social work role in human and agro-industrial development is crucial, Sri Lanka a glittering pearl of the Orient, Domestic violence an enforced silence, Gender equality in Sri Lanka a slow process, Japan's bows prove stronger than tsunami waves, Commoner weds a Royal to become future Queen of England, and Dr Who to have children?*, just to mention a few.

**The book will provide you with interesting and enjoyable reading.**



Books can be obtained directly from the author. The book is priced at $12.50. You can order your copy or copies at the rate of $16.00 per copy inclusive of postage from Mathu Liyanage, 7 St Marys Street, St Marys SA 5042. Payment may be made by cheque, money order or by crediting his account BSB 765-102, A/c No.5005537 at the Commonwealth Bank, and advising him of the deposit by telephone (08) 82779074, email mathu27@yahoo.com or post.



**LANKAN AUTO CARE**

**Licensed Roadworthy Tester (R.W.C)**



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




MELWAY REF 89 J 5

**Ranjith Perera**
**Mob: 0409 866 886**

**9798 2200**

**14/30 Tower Court Noble Park 3174**